
# මෙත් සවිය

**මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය**


මෙත් සවිය සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව METHSAVIYA NEWSLETTER

❊ මෙත් සවිය දහ හත් වන කාණ්ඩය ❊ තිස් හය කලාපය ❊ 2020 ජූලි



"මෙත් සවිය සඟරාව" අංක QD/63/පුවත්/2020 යටතේ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ලංකාවේ ලියාපදිංචි කරන ලදී.


ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය හා ලිපි එවිය යුතු ලිපිනය :
අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්මගවේෂී බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.


මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org






## 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම

**දැක්ම :** බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වූ ඓතිහාසික මහියංගන රාජමහා විහාර භූමියෙහි අසූහාර දහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ පිළිමය පමණක් අඩි 84ක උසින් සහ පාදම සමග සම්පූර්ණ උස අඩි 100කින් යුක්ත ව අහසින් වඩින ඉරියව්වෙන් යුත් ලක්දිව උස ම හිටි පිළිමවහන්සේ වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමාවහන්සේ ඉදිකිරීම.

**අරමුණ :** අප තථාගත ගෞතම බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් නම මසක් ඇවෑමෙන් වූ දුරුතු පුර පසළොස්වක පොහෝ දින ශ්‍රී ලංකාද්වීපයේ මහියංගනයේ මහවැලි නදිය අසබඩ මහානාගවන නම් වූ උද්‍යානයෙහි පැවැත්වෙන මහායක්ෂ සංගමය දිව්‍යසින් දැක පළමුවර ශ්‍රී ලංකාවට වැඩම කොට, ඉහළ අහසේ පෙනී සිට, නොයෙකුත් ප්‍රාතිහාර්ය දක්වා යක් පිරිස් දමනය කර, ඔවුන් ගිරි දිවයිනට යවා, මෙම දිවයින ධර්මයෙහි පැවැත්වීමට සුදුසු ස්ථානයක් බවට පත්කළ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර වන ලද්දා වූ ද, බුදුරජාණන් වහන්සේ ජීවමාන ලෙස වැඩසිටි කාලයේ දී ම තනන ලද්දා වූ ප්‍රථම චෛත්‍ය රාජයාණන් වහන්සේ ලෙස මහාවංශය ඇතුළු මූලාශ්‍රයන් හි සඳහන් වන ඓතිහාසික මහියංගන රාජමහා විහාරයට අයත් පුදබිමෙහි මෙතෙක් උස බුදුපිළිමයක් ගොඩනගා නැතිබැවින් එම අඩුව සපුරා බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සමරණු පිණිස ද, ඒ වෙනුවෙන්, බුද්ධශාසනය අවසානය වන තෙක් පවතින රට ලෙස සැලකෙන ශ්‍රී ලංකාද්වීපයෙහි චිරාත්කාලයක් පවත්නා පූජා වස්තුවක් ලෙස අසූහාරදහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට අධාරකයක් නොමැති ලක් දිව උස ම හිටි පිළිමය වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ගොඩනගා බුදුන් වැඩි ස්ථානයෙහි බුද්ධාලම්බන ප්‍රීතිය වැඩිවන අයුරින් බැතිමතුන් හට වන්දනා මාන කර කුසල් රැස්කරගැනීමට අවස්ථාව සැලසීම සහ බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය පිණිස උපයෝගී වීම.

## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා වන සියළුම ආධාර **"සම්පත් බැංකුවේ ( 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා අරමුදල )** නමින් ඇති **"000560001118"** ගිණුමට බැර කරන්න.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.

දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07


## මෙත් සවිය 2019 / 2020 වසර සඳහා විධායක කමිටුව

### ගරු ජ්‍යෙෂ්ඨ පැවිදි අනුශාසක

ශ්‍රී සුමංගල විද්‍යාවතංස, අග්ගමහා පණ්ඩිත, නේපාලයේ චාරුමතී රාජමහා විහාරාධිපති, බුරුමයේ මියන්මාර් ශ්‍රී ලංකා බෞද්ධ මධ්‍යස්ථානාධිපති හා ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධම්මාශ්‍රමාධිපති, ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ

අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස උත්තරීතර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

### ගරු පැවිදි අනුශාසක

රත්මලානේ මල්ලිකාරාමාධිපති සහ වැල්ලවත්ත ශ්‍රී විජයාරාමාධිපති, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකවේදී

පූජ්‍යපාද රණස්ගල්ලේ ඤාණවීර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

### ගරු සභාපති

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී

මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දු:ක : 0714800800, ෆැක්ස් : 0112 515 615

විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

කෝසල එදිරිසිංග මහතා — දු.ක : 0716 322 306

දයානන්ද ඉලේපෙරුම මහතා — දු.ක : 0714 334 954

**ගරු සම ලේකම්වරු**

මංජුල පත්මකුමාර මහතා. — දු.ක : 071 529 5855

පියල් චන්ද්‍රතුංග මහතා — දු.ක : 071 450 1358

**ගරු භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා — දු.ක : 0775 994 987

**ගරු උප භාණ්ඩාගාරික**

චේනුක ජයනාත් මහතා — දු.ක : 0714 333 868

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. — දු.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මෙනුර ඩයස් මහතා 0713370782 / ජගත් ප්‍රසන්න මහතා 0715836653 චමින්ද ඉන්දික මහතා 0712299212 / මාලන් කන්දගේ මහතා 0725361040 / නුවන් පෙරේරා මහතා 0777005772 / හර්ෂ පෙරේරා මහතා 0773258010

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

චින්තක බණ්ඩාර මහතා — දු.ක : 0718 114 477

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී.පී. පෙරේරා මහතා — දු.ක : 0719441269

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය — දු.ක : 0777 613 659

**තරුණ කමිටුව - සභාපති**

ලහිරු චන්දික ද සිල්වා මහතා — දු.ක : 0702 089 956

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

එන්. එම්. දහනායක මහත්මිය — දු.ක : 0718 163 274

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා — දු.ක : 0714 078 429

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

යසින්ත රෂාන් මහතා — දු.ක : 0714 501 358

**අධීක්ෂණ කමිටුව**

ජී. ජී. තිලකසිරි මහතා / වික්‍රම ගුණදාස මහතා

**සුභසාධක කමිටුව**

සුනිල් හේවාවසම් මහතා — දු.ක : 0714 963 583

**පර්යේෂණ කමිටුව - සභාපති**

චින්තක බණ්ඩාර මහතා — දු.ක : 0718 114 477

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර පහළොවකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි**. වර්තමාන සාමාජික සංඛ්‍යාව 6,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් **"මෙත් සවිය මෛත්‍රී සංසදය"** පසුගිය දහසය වසර පුරා සමථ විපස්සනා භාවනාව හය දහස් පන්සියයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර දහසය පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 2020 අගෝස්තු 02 වන ඉරු දින, අපවත් වී වදාල අහංගම ආනන්ද හිමියන් ඇතුළු මෙත් සවියේ මියගිය සාමාජික සාමාජිකාවන් හා පවුලේ ඥාතීන්ට පින් පැමිණවීම පිණිස පැවැත්වෙන සංඝගත දක්ෂිණාව

අපවත් වී වදාල අහංගම ආනන්ද හිමියන් ඇතුළු මෙත් සවියේ මියගිය සාමාජික සාමාජිකාවන් හා පවුලේ ඥාතීන්ට පින් පැමිණවීම පිණිස පවත්වන සංඝගත දක්ෂිණාව 2020 අගෝස්තු මස 02 වන ඉරු දින පෙරවරු 10.00 සිට මධ්‍යහන 12.00 දක්වා අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08 දී පැවැත්වේ.

එදින දානය හා පිරිකර භාර ගැනීමට කැමති පිංවතුන් මෙත්සවිය කාන්තා කමිටු සභාපතිනී රංජනී උඩුගොඩ මහත්මිය (0777 613 659) සහ දාන සංවිධායක හේමන්ති පෙරේරා මහත්මිය (0777 727 718) විමසන්න. මෙත් සවිය මගින් දිවා ආහාරය සැපයෙන බැවින් එයට පැමිණෙන අය ඒ පිළිබඳව 2020 අගෝස්තු මස 01 වන දින ට පෙර මෙත් සවිය කාන්තා කමිටු සභාපතිනී රංජනී උඩුගොඩ මහත්මිය දැනුම් දෙන්න.

### 2020 අගෝස්තු 02 වන ඉරු දින, මෙත් සවිය, වාර්ෂික මහ සභා රැස්වීම සහ ධර්ම දේශනාව

අප්‍රේල් මස පැවැත්වීමට නියමිතව තිබී ''කොවිඩ් ව්‍යසන'' තත්වය මත කල් දමන ලද මෙත් සවිය 17 වන මහා සමුළුව 2020/08/02 වන ඉරු දින දී පැවැත්වේ. 2019 අයවැය ඉදිරිපත් කිරීම හා 2020 සඳහා නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08 හි. ධර්ම දේශනාව අවසානයේ දී පැවැත්වේ. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇති නම් 2020/07/30 දිනට පෙර කාර්යාලයට භාර දෙන්න. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියලුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට පළමුව සාමාජිකත්වය අලුත් කරගන්නා මෙන් ඉල්ලමු. ''කොවිඩ් ව්‍යසන'' තත්වය මත ඉතා සුළු පිරිසක් සහභාගී වන ලෙස සෞඛ්‍යාරක්ෂාව සහිතව පවත්වන මෙම සංවත්සරික මහා සභාව දින වෙනදාට පැවැත්වෙන මෛත්‍රී භූෂණ සම්මාන උළෙල හා පසුගිය වසරේ දී අනුපමේය සේවයක් කර ඇති සාමාජිකයින්ට පිරිනමන මෙත් සවිය විශිෂ්ඨ සේවා සම්මාන උළෙල මෙවර නොපැවැත්වේ. **(නිලතල සඳහා අයදුම් පත්‍රය සඟරාවේ ඉදිරි පිටක ඇත.)**

මහසමුළුව ආරම්භයට පෙර ප.ව. 2.00 සිට 3.00 දක්වා පැපැලියාන සුනේත්‍රාදේවී පිරිවෙනේ නියෝජ්‍ය පිරිවේනාධිපති, ශාස්ත්‍රපති පණ්ඩිත, ගොම්බද්දල දමිත ස්වාමීන් වහන්සේ විසින් සුමධුර ධර්ම දේශනයක් පැවැත්වේ.

**17 වන සංවත්සර සභාවේ න්‍යාය පත්‍රය. - (ප.ව. 3.30 - 4.30)**

- ආජීව අෂ්ඨමක සීලයේ පිහිටීම.
- මෙත් සවිය තේමා ගීතය වාදනය කිරීම.
- න්‍යාය පත්‍රය කියවීම.
- පසුගිය වාර්ෂික මහසභා වාර්තාව ඉදිරිපත් කිරීම.
- වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා අනුශාසක මණ්ඩලය, නිලධාරී මණ්ඩලය හා විගණකවරු පත්කිරීම.
- ස්තුති කතාව.
- ජාතික ගීය වාදනය කිරීම.
- සමාප්තිය සහ තේ පැන් සංග්‍රහය.

### 2021 වසර සඳහා නොමිලයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය

2021 වසර මෙත් සවිය දින දර්ශනය ලබා නොගත් අයහට එය දෙසැම්බර් 12 සිට බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ පිහිටි මෙත් සවිය කාර්යාලයෙන් ලබාගත හැකිය.

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එළ කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එළ කරනු ලබන දැන්වීම් 2020 / 08 / 30 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

**බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරස්ථානයේ සංඝාවාස කුටි 4ක් තනා ඇති අතර ඒවා ටයිල් අල්ලා නාන කාමර කට්ටල සහ විදුලි පංකාවක් සවිකර මෙම අටමහා කුසලයට සහභාගී වී සඟසතුකර පූජා කිරීමට කැමති පිංවතුන් වෙතොත් (කුටියක් හෝ කොටසක් බැගින්) වෙතොත් මෙත් සවිය සභාපතිතුමා අමතා දැනුම් දෙන්න.**

# දස අකුසල් හි ආදීනව

### 1) ප්‍රාණඝාතය

| | |
|---|---|
| පෙර අඟනක් එළු දෙනක ඉස | සිඳා |
| සිය ලඟ වැලඳී ගිනිදැල් නිරය දුක් | විඳා |
| ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් | ලදා |
| මෙම රඟ වේය කාටත් අකුසලේ | ලෙදා |

තේරුම :- අතීතයෙහි එක් කාන්තාවක් එළු දෙනකගේ ගෙල සිඳ මුළු ශරීරයම වෙලාගත් අපායේ ගිනි දැල්වලින් දුක් විඳ ඇගේ ශරීරයේ ලෝම ගණනට හිස් කැපුම් ලැබුවා ය. අකුසල කර්මය කාටත් මේ ලෙස සිදු වේ.

### 2) සොරකම් කිරීම

| | |
|---|---|
| කෙළියට කඩක් සඟවා යහළුවෙකු | ගෙනේ |
| එළිකොට නැවත දුන් මිනිසෙකුට | එතෙකිනේ |
| විළි වැස්මක් නොමවිය දෙව් වුවත් | අනේ |
| කෙළියට වත් නොකරවු සොර කමක් | දැනේ |

තේරුම :- ක්‍රීඩා පිණිස යහළුවෙකුගේ රෙදි කැබෙන්නක් සඟවා (එය) එළිකොට ආපසු දුන් යහළුවෙකුට ඒ තරමින්. දෙවියෙකු වීත් විළි වැසීමක් නොවීය. සෙල්ලමටවත් දැනගෙන සොරකමක් නොකරව්.

### 03) පරදාර සේවනය කිරීම

| | |
|---|---|
| නැණනැති අයෙක් පෙර පරදර පව් | පැවති |
| ගුගු රති ගැලෙති තිස්වා දහසින් | උඩෙති |
| නිම නැති තවම ලෝකුඹු නිරයේ | පැසෙති |
| නොකරති මෙපව් නුවණැති අය වැඩ | කැමති |

තේරුම :-නුවණ නැති කෙනෙක් අතීතයෙහි පරදාර කර්මයෙහි යෙදී තවම කෙළවරක් නැති ලෝකුඹු නරකයෙහි පැසෙති. (එහි) ගුගුරති. ගිලෙති. අවුරුදු තිස් දහසකින් උඩට එති. වැඩ කැමති නුවණ ඇති අය මේ පව් නොකරති.

### 04) බොරු කීම

| | |
|---|---|
| ළැදිව රජක් බොරු බස් කී | විගසකය |
| නැතිව රිද්දි බලයක් ඒ මිනිස් | කය |
| පොළොව පලාගෙන ගොස් වැටිණි | නරකය |
| මෙලොව සතුනි ඉන් බොරු කීම | නරකය |

### 05) කේලාම් කීම

| | |
|---|---|
| පිසුණු කියා සඟ දෙනමක් වෙනස් | කොට |
| පැසුණු එකෙක් නිරයේ කල්පයක් | සිට |
| මුහුණු කුණුව තව පේතව විඳී | ගැහැට |
| පිසුණු බසක් නොකියවු අද පටන් | කොට |

තේරුම :-කේලාම් කියා සංඝයා වහන්සේලා දෙනමක් භේදකර අපායේ කල්පයක් දුක් විඳි කෙනෙක් මුහුණ කුණු වී ප්‍රේතයෙකුව ගැහැට විඳියි. ඒ නිසා අදින් පසු කේලාම් බසක් නොකියවු.

### 06) පරුෂ බස් කීම

| | |
|---|---|
| පෙර එක් සඟෙක් ගණහට බැණ | නපුරු |
| නිරයේ වැටිණි බිම සත් ගවු වැඩෙන | තුරු |
| ගොරදුක් විඳී තව පේතව සිට | කුරිරු |
| පරහට එයින් නොකියවු බස් | නොපියකරු |

තේරුම :-ආදියෙහි එක් භික්ෂුවක් සංඝයාට පරුෂ බස් කියා පොළොව ගව්වක් වැඩෙන කල් අපායේ වැටී සිටියේ ය. (ඔහු) තවමත් ප්‍රේතයෙකුව කෲරවූ තදබල දුක් විඳියි. ඒ නිසා අප්‍රිය කර වචන අනුන්ට නොකියන්න.

### 07) සම්පප්ප්‍රලාප

| | |
|---|---|
| කීවොත් වැඩක් නැති බස් ගොර නිරා | ගැබේ |
| මහත් කුරිරු දුක් විඳ යළි ආවොත් | මොබේ |
| කීවත් සැබෑ නොගනිති ඔහුගේ බස් | සබේ |
| ගෙවත් සසර දුක් මෙම නොකියතොත් | සැබේ |

තේරුම :-වැඩකට නැති බස් (සම්පප්ප්‍රලාප) කථාකළ හොත් ඝොර වූ නිරය තුළ කෲර දුක් විඳ නැවත මෙහි ආවොත් ඇත්තක් කීවත් ඔහුගේ වචන නොපිළිගනිති. මේවා නොකියන අය සැබවින්ම සංසාර දුක අවසන් කරති.

### 08) අභිද්‍යාව

| | |
|---|---|
| අන් සතු දෙයක් වේවයි සිතුව | තමහට |
| ඉන් දුගතියෙහි දුක් විඳ අව මේ | ලොවට |
| උන් සිතුවා සිදුනොම වෙයි සිතු | ලෙසට |
| මින් මතු සිතක් නොසිතව් එවැනි | පවකට |

තේරුම :-අනුන්ට අයිති දෙයක් තමන්ට ලැබේවායි සිතුවහොත් එයින් අපායෙහි දුක් විඳ මේ ලෝකයට ආවත් ඔවුන් සිතූ දෙය සිතූ ආකාරයට සිදු නොවෙයි. මෙයින් පසු එවැනි පාපිශ්ට සිතක් ඇති කර නොගනිවු.

### 09) ව්‍යාපාදය (ක්‍රෝධය)

| | |
|---|---|
| බෝවා දහස් පැසවන නිරය වෙන | වෙන |
| වෑපාද නම් රුදු මන බව නපුරු | වන |
| ආබාධ දුක් විඳුවන උපනුපන් | තැන |
| වෑපාදයක් නොසිතව් දැන දැන | සිතින |

තේරුම :-වෙන වෙන අපායවල් අවුරුදු බොහෝ දහස් ගණනක් දුක් විඳවන්නා වූ ව්‍යාපාද නම් වූ නපුරු මනසක් ඇති බව ය. උපන් උපන් තැන කරදර දුක් විඳුවන්නා වූ ක්‍රෝධයක් දැන දැන සිතින් නොසිතවු.

### 10) මිත්‍යාදෘෂ්ටිය

| | |
|---|---|
| කලක් නිරා දුක් විඳ විටක ගොඩ | දුටු |
| නොයෙක් රෝග අට ගෙන ගත වෙයි | අරිටු |
| උදයක් නුවණ නැති වේ සිත වෙයි | කිලුටු |
| මෙවක් පටන් විස මෙන් සිතව | මිසදිටු |

තේරුම :-කාලයක් අපායේ දුක් විඳ ඉන් මිදුණු කල්හි ද නොයෙක් රෝග ඇති වී අප්‍රිය වෙයි. නුවණ මුළුමනින් නැති වෙයි. සිත කිලුටු වෙයි. (ඒ නිසා) මෙතැන් සිට මිත්‍යාදෘෂ්ටිය විස මෙන් සිතව්.

| | |
|---|---|
| මේ දස අකුසලි, ඉනෙකක් | කළහොත් |
| උපදෙසකින් බසකින් | කරවූවොත් |
| ඒ විගස එක් දහසකින් | සිතුවොත් |
| නොවලස මොහු සෑම දෙන නිරයට | යෙත් |

තේරුම :-මේ දස අකුසල් වලින් එකක් කළහොත් (නැත්නම්) වචනයකින් හෝ උපදේශයකින් කරවුවහොත් ඒ සමග ම ඊට එකඟ වුවහොත් ප්‍රමාදයකින් තොරව මොවුහු සියලු දෙනාම අපායට යති. ඉහත දස අකුසලයෙන් වැළකීම පිණිස දස කුසල් සඳහන් ආජීව අෂ්ඨමක ශීලය නිති රකින්න.

| | |
|---|---|
| කරදර දස අකුසලයෙන් | නොමිදී |
| වැරසැර පෑවොත් මෙමිනිස් | ලොවදී |
| මෙරගිර මුදුනෙන් හුණු මෙන් | නොරැඳී |
| පරතෙර නැති දුක සයුරේ | කිමිදී |

තේරුම :-කරදරකාරී දස අකුසල්වලින් වෙන් නොවී මේ මනුෂ්‍ය ලෝකයේ දී සැරවැර පෙන්වුවහොත් මහාමේරු පර්වතයෙන් නොරැඳී වැටුණාක් මෙන් කෙළවරක් නැති දුක් සයුරේ ගිලී යයි.

# මෙත් සවිය

**මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ**

# 16 වන සංවත්සර වාර්තාව

මෙත්සවිය 16 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව මෙත්සවිය නිර්මාතෘ සහ මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 අප්‍රේල් 07 දින ධම්මගවේෂී බෞද්ධාශ්‍රම ධර්මශාලාවේ දී පවත්වන ලදී. ප්‍රධාන කමිටුව නියෝජනය කරමින් චින්තක බණ්ඩාර (උපසභාපති), කෝසල එදිරිසිංහ (සමලේකම්), මංජුල රණසිංහ (සමලේකම්), චමින්ද ඉන්දික (භාණ්ඩාගාරික), සුරංග ලියනගේ (උප භාණ්ඩාගාරික), එම්. කේ. ප්‍රියන්ත (සංස්කාරක) යන මහත්වරුන් සහ කාරක සභික මහත්වරුන්ගේ ද, බුදු පිළිම ක්‍රියාකාරී කමිටුව, කාන්තා කමිටුව, දාන-සීල-භාවනා කමිටුව, වෙබ් හා මාධ්‍ය කමිටුව, සුබ සාධක කමිටුව, තරුණ කමිටුව සහ අසරණ සරණ කමිටුව යන කමිටුවන් හී සභාපතිවරු සහ කමිටු සාමාජිකයන්ගේ ද මෙත්සවිය වාර්ෂික මහා සමුළුවට සපැමිණි සමාජිකන්ගේ සහභාගිත්වයෙන් ද මෙත්සවිය 16 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව පවත්වන ලදී. මෙත්සවිය 16 වන සංවත්සරය වෙනුවෙන් පූජ්‍යපාද ශාස්ත්‍රපති පණ්ඩිත මාලිම්බඩ ප්‍රඥාසාර ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනාවක් සංවිධානය කර තිබු අතර උන්වහන්සේගේ විසින් පවත්වන ලද ධර්මදේශනාවකින් අනතුරුව වාර්ෂික මහා සමුළුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.


පළමුව මංජුල රණසිංහ මහතා විසින් මෙත්සවිය 16 වන වාර්ෂික මහා සමුළුව සඳහා වූ න්‍යාය පත්‍රය සභාවට ඉදිරිපත් කරන ලදී. අනතුරුව මෙත්සවිය 15 වන වාර්ෂික මහා සමුළු වාර්තාව මංජුල රණසිංහ මහතා සභාවට ඉදිපත් කරන ලද අතර, එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට කෝසල එදිරිසිංහ මහතා යෝජනා කිරීමෙන් අනතරුව එම යෝජනාව චේනුක ජයනාත් මහතා ස්ථිර කරන ලදී. ඉන් පසුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා 2018-2019 වර්ෂ වල මෙත්සවිය ප්‍රගතිය සහ ක්‍රියාකාරිත්වය සනිටුහන් කරමින් 2018-2019 මෙත්සවිය වාර්ෂික ප්‍රගති වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. වාර්ෂික අයවැය වාර්තාව චමින්ද ඉන්දික මහතා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට පියල් චන්ද්‍රතුංග මහතා යෝජනා කිරීමෙන් අනතරුව එම යෝජනාව වික්‍රම ගුණදාස මහතා ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව න්‍යායපත්‍රයට අනුකූලව මෙත්සවිය ප්‍රධාන කමිටුවේ තනතුරු සහ අනු කමිටු සභාපති තනතුරු සඳහා නව නිලධාරීන් තෝරා පත් කරගැනීමේ කටයුත්ත ආරම්භ කරන ලදී.

මෙත්සවිය ව්‍යවස්ථාව අනුව සියළු කමිටු සමාජිකයන් තම තනතුරු වලින් ඉල්ලා අස්වෙන ලදී. නව නිලධාරී මණ්ඩලය පත්කිරීම සඳහා මෙත්සවිය වෙත ලැබී ඇති අයදුම් පත් අනුව නිලධාරීන් මණ්ඩලය වෙනුවෙන් යෝජිත නම් මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව උප සභාපති තනතුරු සඳහා දයානන්ද ඉලේපෙරුම සහ කෝසල එදිරිසිංහ යන මහත්වරුන්ගේ නම් ද, සම ලේකම් තනතුරු සඳහා පියල් චන්ද්‍රතුංග සහ මංජුල රණසිංහ යන මහත්වරුන්ගේ නම් ද, භාණ්ඩාගාරික තනතුර සඳහා සුරංග ලියනගේ මහතා ද, උප භාණ්ඩාගාරික තනතුර සඳහා චේනුක ජයනාත් මහතා ද, සංස්කාරක තනතුර සඳහා එම්.කේ. ප්‍රියන්ත මහතා ද, කාරක සභික වරුන් ලෙස මාලන් කන්දගේ, මෙනුර ඩයස්, නුවන් පෙරේරා, හර්ෂ පෙරේරා, චමින්ද ඉන්දික, ජගත් ප්‍රසන්න යන මහත්වරුන් ද තෝරා පත් කරගැනීමට යෝජනා විය. තවද වෙබ් හා මාධ්‍ය කමිටුවේ සභාපතිත්වය සඳහා චින්තක බණ්ඩාර මහතාද, දාන-සීල-භාවනා කමිටුවේ සභාපතිත්වය සඳහා යසින්ත රෂාන් මහතා ද, පර්යේෂණ කමිටුව පිහිටුවා එහි සභාපතිත්වය සඳහා චින්තක බණ්ඩාර මහතා ද, සුභසාධන කමිටුවේ සභාපතිත්වය සඳහා සුනිල් හේවාවසම් මහතා ද යන ලෙස නම් යෝජනා කරන ලදී. එම සියළු නිලධාරී පත්කිරීම් සහා සම්මත කිරීම සඳහා චමින්ද ඉන්දික මහතා යෝජනා කල අතර සුනිල් හේවාවසම් මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. 2019-2020 මීලග වර්ෂය සඳහා විගණන වරුන් ලෙස MKJ Associate ආයතනය තෝරාපත් කරගැනීමට මංජුල රණසිංහ මහතා යෝජනා කල අතර එම යෝජනාව චමින්ද ඉන්දික මහතා ස්ථිර කරන ලදී. 2019-2020 මීලග වර්ෂය සඳහා සමාගම් ලේකම් තනතුර සඳහා රොබට් හේවගේ මහතා තෝරාපත් කරගැනීමට කෝසල එදිරිසිංහ මහතා යෝජනා කල අතර එම යෝජනාව මාලන් කන්දගේ මහතා ස්ථිර කරන ලදී.

ඉන් අනතුරුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් මෙත්සවිය 16 වන වාර්ෂික මහා සමුළුව සඳහා විවිධ ආකාරවලින් සහයෝගය දැක්වූ පිරිසට සහ ආයතන වලට සංසදයේ කෘතඥ පූර්වක ස්තුති ප්‍රකාශ කරමින් ස්තුති කතාව කිරීමෙන් අනතුරුව මෙත්සවිය 16 වන වාර්ෂික මහා සමුළුවේ වැඩකටයුතු නිමාවට පත් විය.

# රත්නමාලී යන්ත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| සං සාර සාරොෂ විනීත නී | සං | - | සං නීත සාතං සුචිසාර ධී | සං |
| සං ධීරකං සොණණ තනුපලා | සං | - | සං ලාප දෙසිං පණ මෙහි සා | සං |
| සං සාහිගං කෙවළ මොහ නා | සං | - | සං නාහකං මාර රණෙ විසෙ | සං |
| සං ඉසවිතං දසි මුදර හා | සං | - | සං හාර ධමමං පණ මෙ සද | සං |
| සං දසගං නා සිත පාප නා | සං | - | සං නාප ධංසිං හතඝොර පා | සං |
| සං පාර ගාමිං සුචිසාර වා | සං | - | සං වාර සංඝං පණ මෙ රසා | සං |



මහා බුද්ධියෙන් නිවන් අවබෝධ කර සංසාර නැමති මහ සයුරෙන් එතර වූ ප්‍රිය වචනයෙන් ධර්මය දේශනාකර කණක වර්ණ දේහයක් ඇති මහශාස්තෘවරයාණන් වූ සම්මා සම්බුදුරාජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා...

සියලු කෙලෙස් දුරු කිරීමට අවිද්‍යාවෙන් තොර මහ එල ලැබීමට ආධාර වන ශ්‍රී සද්ධර්මයට මාගේ නමස්කාරය වේවා...

මරඟනන් පරදවා සියලු මෝහාන්ධකාරය දුරුකර බිය නැති කළ සංසාර නැමැති සයුරෙන් එගොඩ වූ අර්හත්වයට පැමිණියා වූ මහා සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා...

මෙම මහා බලැති යන්ත්‍ර මණ්ඩලය දළදා මැදුරේ සහ රුවන්මැලි චෛත්‍ය රාජයාගේ ආරක්ෂාව සඳහා යොදා ඇති බව සඳහන්වේ. බෞද්ධ සාහිත්‍යයේ ඇති ඉතා අගනා ගාථා තුනක් ඇසුරු කර මෙම යන්ත්‍රය සකස් කර ඇත. බුද්ධ, ධම්ම, සංඝ ගුණ කියැවෙන මෙම ගාථා තුන ගණ පිහිටුවා ගණිත ශාස්ත්‍රයට අනුකූලව සකස් කර තිබේ. මෙය බෞද්ධ කලා ඉතිහාසයේ ඇති අති විශිෂ්ට නිර්මාණයකි.

මෙම ගාථාවන්හි ඇති විශේෂ ලක්ෂණ අවබෝධයෙන් වටහා ගත යුතුයි. සියලු ගාථා පෙළකම ''සං'' යන අක්ෂරයෙන් ආරම්භව ''සං'' අක්ෂරයෙන්ම අවසන්වන අතර ගාථා තුනෙහිම ''සං'' අක්ෂර 24 ක් ගැබ්ව ඇත. සියලු පෙළකම අක්ෂර 11 කට සීමා වී ඇත. පළමු ගාථාවෙහි තුන්වන පෙළේ ''සොණ්ණ'' යන වචනමයේත් දෙවනි ගාථාවෙහි සතරවන පෙළේ ''ධම්ම'' යන වචනයේත් අකුරු වශයෙන් නොව අකුරු දෙකකින් යුත් වචන සැටියට ගණන් ගත යුතුයි. එයට හේතුව ''ණ'' බැඳි ''ණ'' සහ ''ම'' බැඳි ''ම'' ආවිට ගණන් ගැනෙන්නේ අකුරු එකක් වශයෙනි. එවිට සෑම පෙළකම අක්ෂර 11 වනු ඇත.

ගාථා තුනෙහි අක්ෂර මුළ ගණන 132 කි. තවද මෙහි ඇති විශේෂ ලක්ෂණයක් නම සෑම පෙළෙහිම අවසාන වචනය දකුණ සිට වමට කියවූ විට එම වචනයම දෙවෙනි පදයේ පළමුවෙනි වචනය වේ. මෙ ආකාරයට සෑම පෙළකම වචනය දකුණ සිට වමට කියවූ විට එන ''සංසාර'' නැමැති වචනය නැවතත් පළමුවැනි පෙළෙහි මුල් වචනය වේ.

යන්ත්‍ර මණ්ඩලය පරීක්ෂා කර බැලීමේදී එය පිබිදි ඇති නෙලුම් මලක ස්වභාවය ඇති සටහනක් සේ සකස් කර ඇත. මෙය කොටස් තුනකට බෙදා ඇති අතර පළමුවෙනි කොටසේ ලොකු නෙලුම් පෙති 12 ක් දක්නට ඇත. දෙවැනි කොටසේ කුඩා නෙළුම් පෙති 12කි. තුන්වැනි මැද රවුම් ගැබ ඉතිරි කොටස වේ. එක් නෙලුම් පෙත්තක අක්ෂර 5 බැගින් අක්ෂර 60ක් වේ. කුඩා නෙලුම් පතෙහි අක්ෂර 2 බැගින් 24 කි. මැද තනි ගැබයේ එක ''සං'' අක්ෂරයක් වේ. එවිට යන්ත්‍ර මණ්ඩලයේ අක්ෂර 85 කි. ශ්‍රී අකුරු 12 සහ බුද්ධං, ධම්මං, සංඝං සරණං ගච්ඡාමි යන වචන යොදා ඇත්තේ අලංකාරයක් වශයෙනි.

ගාථා තුන පරීක්ෂා කිරීමෙදී ගාථා පෙළෙහි අක්ෂර 132 කි. විශේෂ අංගයනම යන්ත්‍ර මණ්ඩලයෙන් ගාථා කියැවීමෙදී අක්ෂර 85 කින් ගාථා තුන කියැවෙන බවයි. මෙසේ අක්ෂර 47 අඩුවී ඇති ක්‍රමය නම් ගාථාවේ ''සං'' අක්ෂර 24 න් 23 ක් අඩුවීමත් කුඩා නෙලුම් පත්වල ඇති අක්ෂර දෙක දෙවරක් කියවෙන හේතුවෙන් එම අක්ෂර 24 ද අඩුවෙන් ගණන් ගත යුතු හෙයිනි. යන්ත්‍රයෙන් ගාථා තුන කියවිය හැකි ආකාරය මෙසේය.

මැද ගැබයේ ඇති ''සං'' අක්ෂරය සිට දකුණට ඇති කුඩා නෙලුම් පතෙහි ඇති අක්ෂර දෙක වන ''සා-ර'' යන වචනය සමග ආසන්න ඇති ලොකු නෙලුම් පෙතෙහි ඇති අක්ෂර පස වන ''සා, රෝ, ස, වි, නි'' යනුවෙන් නැවත එයට ආසන්න ඇති කුඩා පතහි ඇති අක්ෂර දෙක වන ''ත, නී'' කියවා නැවත මැද ගැබයේ ''සං'' අක්ෂරයට කිය යුතුයි.

එවිට ''සංසාර සාරෝස විනිත නිසං'' යන පෙළ සම්පූර්ණ වේ. මේ අකාරයට නැවත ''සං''

අක්ෂරයෙන් පටන්ගෙන කුඩා පෙතෙහි ඇති ''නී, ත'' යන අක්ෂර අනුව කියවය යුතුයි. ඉතිරි අකුරු කියවීමේ දී යන්ත්‍රය වම සිට දකුණට කරකවා කියවීම ඉතා පහසුය. ගාථා තුන අක්ෂර 85 කින් කියවෙන මහඟු ආකාරය ඔබට දැකගත හැකි වේ.

**පොත පත ඇසුරෙන් උපටා ගැනීමකි.**

එම්. කේ. ප්‍රියන්ත - 18-2962



## ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති සමරූ බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2020. 02. 01 සිට 2020. 03. 31 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

**(ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)**


**මෙම විස්තර www.methsaviya.org වෙබ් අඩවියෙහි ද ඇතුලත් වන අතර බුදු පිළිම වහන්සේ නෙළීම එහි ස්ථාපිත කැමරා මගින් සජීවීව නැරඹීමට ඔබගේ ජංගම දුරකථනයෙන් පහත App ඇප් එක බාගතකර ස්ථාපනය කරගන්න.**

**App Name - HikConnect / User name - 940772257287 / Password - Meth@123**

| ටිකට් පත් අංකය | නම | සාමා:අංක | මුදල රු |
|---|---|---|---|
| රුපියල් 100 ටිකට් 846 | මෙත්සවිය සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 84,600 |
| 14/C-796 | එම්. ප්‍රසාධි මිය | | 500 |
| 14/A-57526-57550 | ආර්. එම්. ඩී. කේ. රත්නායක මිය | 43-6550 | 2,500 |
| 14/A-58150-58175 | බී. ඒ. තේජා පද්මාන්ගනී මිය | 5-0952 | 2,500 |
| 14/A-56725-56750 | කේ. එම්. ඩී. බණ්ඩාර මයා | 42-6364 | 2,510 |
| 14/A-51526-51550 | ප්‍රභාත් | 41-6343 | 2,500 |
| 14/A-58275-58300 | පුන්‍යා නිශාන්ති මිය | 43-6600 | 2,500 |
| 14 E-213 | ජී. ලියනගේ | | 5,000 |
| 980 | චන්ද්‍රා මිය | | 300 |
| 981 | චන්ද්‍රලතා මිය | | 50 |
| 14 D-446/447/14 C 797 | ආර්. ඩබ්. ගුණරත්න | | 2,500 |
| 14 D-443 | උපේක්ෂා ජයමාලි මිය | | 1,000 |
| 14 D-448 | පි. එම්. සේනාදීර | 11-2014 | 1,000 |
| 14 D-449 | පුෂ්පා විජේතුංග මිය | | 1,000 |
| 14 D-1011/1012 | මානෙල් සිරිවර්ධන මිය | | 2,000 |
| 14 D-1013/14 C-798 | මලිත් නිරෝෂන් කුමාර් මයා | | 1,500 |
| 824/825 | ජේ. ඒ. එන්. එම්. ශ්‍යාමිනි මිය | 34-5246 | 5,000 |
| රුපියල් 500 ටිකට් 03 | මෙත්සවිය සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 1,500 |
| රුපියල් 1000 ටිකට් 08 | මෙත්සවිය සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 8,000 |
| | මෙත්සවිය සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 8,800 |
| 976 | ඩී. එම්. ජයවර්ධන | | 3,000 |
| 977 | සේනාරත්න බණ්ඩාර මයා | | 2,000 |
| 978 | සචින්ද්‍රයා | | 250 |
| 979 | ඩී. එස. හේවාගීගම | | 250 |
| 53418 | යූ. ඒ. ප්‍රේමලාල්සිරි | 03-0603 | 100 |
| 14 G-130 | බී. විජේතුංග මයා සහ ජී. විජේතුංග මිය | 22-3460 | 100,000 |
| 14 G-131 | පී. සුමනා බස්නායක මිය | 02-0393 | 100,000 |
| 14 G-132 | බම්බාව රාජමහා විහාරාධිපති පූජ්‍ය ගොමගොඩ ශ්‍රී රතනසාර නාහිමියන් වහන්සේ | | 100,000 |
| 14 G-133 | සුනිල් හේවාවසම් මයා | 37-5669 | 100,000 |
| 59249 | රෙජිලින් මිය | | 100 |
| 14 D-1014 | මාලනී මිය | | 1,000 |
| 59248 | මධූ මිය | | 100 |
| 14 I-20 | අනෝමා මනෝහාරී ලියනාරච්චි මිය | 23-3529 | 25,000 |
| 14 G-134 | එච්. කේ. හෙට්ටිගේ මිය | 38-5897 | 100,000 |
| 14 G-135 | අයි.කේ.කේ.හෙට්ටිගේ මිය | 38-5898 | 100,000 |
| 14/F-69 | වශ්නි ලියනගේ මිය | | 10,000 |
| 14/F-124 | ශ්‍රියානි රම්‍යා මිය | | 10,000 |
| 14/F-122 | මංගලිකා ද සිල්වා මිය | | 10,000 |
| 14/F-121 | හේමා ගුණවර්ධන මිය | | 10,000 |
| 14/F - 70/14D- 445 / 444 | ටී. එම්. එස්. සී. තෙන්නකෝන් | | 12,000 |
| 14/F-123 | එස්. එම්. බණ්ඩාර මැණිකේ මිය | | 10,000 |
| | මෙත්සවිය සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 268,700 |
| | ප්‍රසන්න කුමාර මයා | 43-6584 | 2,500 |
| 14 E- | මධූෂාන් චන්තක පෙරේරා මයා | 43-6585 | 5,000 |
| 14 D- | අයි. එම්. සිරිවර්ධන | 01-136 | 1,000 |
| 14 E-214 | මෙලනි ගුණතිලක මධුරප්පෙරුම මිය | | 5,000 |
| 14 G-136 | ධර්මරත්න පැපිලියාන මයා | 42-6349 | 100,000 |
| 14 G-137 | කේ. ඒ. ඩී.ඉලේපෙරුම මයා | 39-6067 | 100,000 |
| 14 J-040 | සි. ටී. ඩී. ඩබ්. ශ්‍රීමති මිය | 23-3610 | 400,000 |
| 438 | අනෝජා මැටිවලකුඹුර මිය | 43-6587 | 20,000 |
| 14/F- | චතුර ජයසිංහ මයා | 23-3654 | 10,000 |

# චරිත සඳහා සුදුසු සමථ භාවනා විධි

ඉහත ලිපියෙහි දක්වා ඇති සතිපට්ඨාන භාවනා විධිවලට අමතරව පහත සමථ භාවනා ද චරිත හැඩගැස්වීම සඳහා කමටහන් වශයෙන් දෙනු ලැබේ.



1. රාග චරිතයට - (11) දස අසුබය
   කායගතා සතිය - පිළිකුල් භාවනාව
2. මෝහ චරිතයට - (1) අනාපානසතිය
3. විතර්ක චරිතයට - (1) අනාපානසතිය
4. ශ්‍රද්ධා චරිතයට - (6) බුද්ධ, ධම්ම, සංඝ, ශීල, චාග, දේවතා අනුස්සතිය
5. බුද්ධි චරිතයට - (3) මරණ, ආහාර පටිකූල, උපසම (නිවන) අනුස්සතිය
6. ද්වේශ චරිතයට - (8) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා (සතර බ්‍රහ්ම විහරණය) සහ නීල, පීත, ලෝහිත, ඕදාත, කසින

* චරිත හයටම - පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආලෝක, ආකාශ - 6, සහ අරූප ධ්‍යාන - 4

කාන්තා කමිටුව

# ප්‍රගති සමාලෝචනය

පසුගිය අවුරුද්දේ සිට 2020 වසරේ මේ ගතවන කාලය දක්වා වූ කාල සීමාව ගැන මෙත්සවිය කාන්තා කමිටුවට සතුටින් සිහිපත් කරන්නට හැකියාව තිබේ.වෙනදා මෙන්ම එම ගතවූ කාලය ද කමිටු සාමාජිකාවෝ සියලූ දෙනාම සහයෝගයෙන්, උනන්දුවෙන් මෙත්සවිය සංසදයේ සියලූ වැඩ කටයුතුවලට සහභාගි වූහ.

සතිපතා ඉරිදා දිනවල සිදුකරන දානමය කටයුත්තක් ලෙස අගය කරන තේ පැන් සංග්‍රහය නොවරදවා ම සිදු කිරීමට අපට හැකිවිය. පසුගිය කාලයේ යම් යම් අපහසුතා මධ්‍යයේ වුව ද සියල්ලන්ගේ ම ස්තූති පූර්වක අනුමෝදනා ලබමින් එය සිදු කෙරුණි.

මෙම ගිලන්පස දානය සඳහා සංගමයේ සාමාජික සාමාජිකාවන් වියහියදම් දැරීමටඉතාමත් උනන්දුවෙන් ඉදිරිපත් වීම සතුටට කරුණකි. එහෙත් සමහර අවස්ථාවල ඇතිවූ තත්වයන් නිසා එම දායකත්වය බාරදීම සංවිධානය කර ගැනීමට නොහැකි වූ අවස්ථා ද තිබුණි. එවැනි අවස්ථාවල කාන්තා කමිටුවේ සාමාජිකාවන් ඉදිරිපත් ව තමන් විසින් සියලූ වියදම් දරමින් එම කටයුත්ත නොකඩවා සිදු කරන ලදී. මෙම තේ දානය පිළිබඳ විශේෂයෙන් කිව යුතු වන්නේ දුර බැහැර සිට පවා ඉරුදින දිවා කාලයේ පංතිවලට පැමිණෙන සංසදයේ සාමාජික පිරිසට මෙම තේ පැන් සංග්‍රහය සකස් කරදීම ඉතාමත් ඉහළින් අගය කරමින් මහාචාර්යතුමන් විසින් ප්‍රශංසාත්මක ව සංගමයේ රැස්වීම්වල දී ප්‍රකාශ කිරීම කාන්තා කමිටුවේ උනන්දුව ධෛර්යය වැඩි කිරීමට හේතු වූ බවයි.

වැඩි ප්‍රසිද්ධියක් නැතිවම කාන්තා කමිටුවේ සාමාජිකාවන් දෙතුන් දෙනෙකු විසින් සිදුකරන සත් ක්‍රියාවක් ගැන ද සඳහන් කළ යුතු ය. සංගමයේ සාමාජිකාවක බලවත් ලෙස රෝගාතුර වූ අවස්ථාවක එම සාමාජිකාවට අවශ්‍ය ඖෂධ ලබා ගැනීමට උදව් කරන ලදී. ඒ සමගම ඒ පවුල්වල දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය වූ ඉහළ මිලක් සහිත පොත පත ද ලබා දෙන ලදී.

සංගමයේ කටයුතු සුපුරුදු ස්වභාවයෙන් බැහැර ව සිදු කරන්නා වූ අවස්ථාවන්හි දී ඇති වූ නොයෙකුත් අඩුපාඩු, අපහසුතා මග හරවා ගනිමින් කා සමඟත් සහයෝගයෙන් කටයුතු කිරීමට අප සාමාජිකාවන්ට හැකිවිය.

මහියංගන බුදුපිළිම වහන්සේ නිර්මාණය සඳහා අරමුදල් රැස් කිරීමේදී ද අප සාමාජිකාවෝ වරින් වර අවස්ථාව ලැබෙන පරිදි ඊට දායක වූහ. සෑම අවුරුද්දකම ආරම්භයේ දී ජනවාරි 01 දින සිදුකරන උදෑසන හීල් දානය පුණ්‍ය කර්මය 2020 ජනවාරි 01 දින සිදුකිරීම මහාචාර්යතුමන් විසින් අප කාන්තා කමිටුවට පවරන ලදී. අඩුපාඩුවක් නැති ව එම පුණ්‍යමය කටයුත්ත සාර්ථක ව සිදු කිරීමට අපට හැකිවීම ගැන ඇත්තේ ඉමහත් සතුටකි.

මහියංගන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ගර්භ නිධානෝත්සවය අප සැමට ඉතා විශේෂ අවස්ථාවක් විය. දුර බැහැර ස්ථානයක, තමන්ට පුරුදු පරිසරයෙන් බැහැර ව, අවශ්‍ය කළමනා සූදානම් කර ගනිමින් මහ සංඝරත්නය, ආරාධිත අමුත්තන් ඇතුළු පිරිසට සංග්‍රහ කිරීම සාර්ථක ව සිදු කිරීමට ද කාන්තා කමිටුවට හැකි විය.

ඒ පිළිබඳ ව විශේෂයෙන් කිව යුත්තේ එවැනි මාහැඟි පුණ්‍ය කර්මයට සහභාගි වෙමින් සංවිධාන කටයුතුවල ඉදිරියෙන් සිට දායක වෙමින් සිත් පහදවා කටයුතු කිරීමට ලැබීම අප ලද මහා භාග්‍යයක් ලෙස සලකන බවය. මේ ජීවිතයේ දී එවන් දුර්ලභ අවස්ථාවකට ක්‍රියාකාරී ව දායකවීමට මාර්ගය පාදා දුන් ගුරුදෙව් මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන්ට අපගේ ගෞරවය හිමිවේවා.

කොවිඩ් වසංගත තත්වයේ දී ප්‍රතිකාර සඳහා සෘජුවම සම්බන්ධ වූ අයි. ඩී. එච් රෝහලට අවශ්‍ය වටිනා වෛද්‍ය උපකරණ ලබා දීමේදී ද කාන්තා කමිටුවේ සාමාජිකාවන් කිහිප දෙනෙකු විසින් මුදල් පරිත්‍යාග සිදුකරන ලදී. මහාචාර්ය තුමන්ගේ මූලිකත්වයෙන් සිදු කළ මාහැඟි පුණ්‍ය කර්මයට මෙවන් අවස්ථාවක දායක වීමට ලැබීම ද භාග්‍යයක් කොට සළකමු.

කන්තා කමිටු සාමාජිකාවන් වැඩි දෙනෙකු මේ වන විට සේවා ස්ථානවලින් විශ්‍රාම ගොස් සිටින බැවින් නූතන සන්නිවේදන මාර්ගවලින් අද දවසේ සිදු කරන කර්තව්‍යයන්ට සම්බන්ධ වීමට ඔවුන් තුළ විශේෂ උනන්දුවක් නොවී ය. එහෙත් මහාචාර්යතුමන් විසින් අප උනන්දු කරවමින් මාරගෝපදේශ ලබා දෙමින් නවීන අන්තර්ජාල සංනිවේදන මාර්ග ඔස්සේ සංගමයේ රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

එය එවැනි අත්දැකීමක් ලැබීමට අපට ලැබුණ මහගු අවස්ථාවක් මෙන්ම රජය මඟින් නිර්දේශිත පරිදි රෝග බියෙන් මිදීමට නිවෙස්වලට ම වී සිටින අපට විශාල ආශිර්වාදයක් ද විය.

මේ දිනවල දිනපතා තෙරුවන් නැමඳ මෛත්‍රී භාවනාවේ ද අප යෙදෙන්නෙමු.(මේ දිනවල දුරකතන මාර්ගයෙන් දැනුම් දී සංවිධානය කර ඇති පරිදි දිනපතා උදය හා සවස 5.49 ට තෙරුවන් නැමඳ මෛත්‍රී භාවනාවේ ද අප යෙදෙන්නෙමු) මෙම ශක්තියෙන් ද මහාචාර්යතුමන්ගේ මඟ පෙන්වීමෙන් හා මෙහෙයවීමෙන් සිදු කරනු ලබන සියලු යහපත් ක්‍රියා මාර්ගයන්ගේ බලයෙන් ද අප රටට පමණක් නොව මුළු මහත් ලෝකයටම බලපා ඇති වසංගත රෝග තත්වය පහව ගොස් නුදුරේ දීම අප මෙත් සවිය මෛත්‍රී සංසදයේ වැඩ කටයුතු නිසි ලෙස සිදු කිරීමට අවස්ථාව ලැබේවා යි පතමු.

තෙරුවන් සරණයි.

**රංජනී උඳුගොඩ (සභාපති කාන්තා කමිටුව)**
**සෝමා දීගල්ල (ලේකම් කාන්තා කමිටුව)**

## තරුණ කමිටුව 2019/2020

## මෙහෙවරෙන් බිඳක්...

මෙත්සවිය තරුණ කමිටුවේ සාමාජිකයන් වන අප විසින් ප්‍රධාන කර්තව්‍යයන් තුනක් සඳහා මුලපුරනු ලැබුවෙමු. ඉන් ප්‍රධාන ම කාර්යය වූයේ සම්බුද්ධත්ව ජයන්ති බුදුපිළිම වහන්සේගේ ගර්භ නිධානෝත්සවය සඳහා පිරුවාණා පොත් වහන්සේ රන් පත්තිරුවල ලියා රිදී මංජුසාවක බහා තැන්පත් කිරීමයි. මෙම මහගු ධර්ම දානමය පුණ්‍යකර්මයට වැඩි පිරිසකට දායක වීමට අවස්ථාව සලසා දෙනු වස් තම අත් අකුරින් ම පිටපත් කිරීමට කටයුතු සම්පාදනය කළෙමු.තව ද පිරිත් දේශනා පිටපත් කරන ලද පත්තිරු සඳහා දායක වී ඒවා රිදී මංජුසා තුළ තැන්පත් කිරීමට ද පින්වතුන්ට අවස්ථාව ලැබුණි. බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ලබා ගැනීම ද අරමුණු කරගනිමින් පරිත්‍යාගශීලීන්ට ඒ සඳහා අවස්ථාව සැලැස්වූයෙමු.

මේ සඳහා පින්වතුන් සහභාගි කර ගැනීම ඉරිදා දිනවල වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දීත් පසළොස්වක පොහොය දිනවල මහියංගන පුද බිමේදීත් සිදුවිය. මෙම ධර්ම දානමය පුණ්‍යකර්මය මඟින් එකතු කරගත් රුපියල් මිලියනයකට (රුපියල් 1,032,000) අධික මුදලක් බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දීමට හැකිවීම අප ලද මහත් වූ භාග්‍යයකි. ඒ සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කළ හා උපකාර කළ අපගේ ගුරුපියාණන් ඇතුළු මව් කමිටුව හා සියලුම කමිටුවලටත් පිං කමට සහභාගි වූ සැමටත් පිං අනුමෝදන් කරමු.

අපවත් වී වදාළ අති පූජ්‍ය අහංගම ආනන්ද මාහිමියන්ගේ සංකල්පයට අනුව මරණයට කැපවූ අසරණ සතුන් නිදහස් කිරීමේ කටයුත්ත ඉදිරියටත් පවත්වාගෙන යාමට ශක්තියක් වනුවස් ,සාමාජිකයින්ට කැට ලබා දීමට ද කටයුතු කරන ලදී. මල් පහ පූජා කිරීම හා සම්බන්ධ දිනයේ දී එයට සමගාමී ව සිදු කරගෙන යනු ලබන කටයුත්ත වන්නේ අසරණ සතුන් නිදහස් කිරීමට, මුදල් එකතු කිරීමට දිරිගැන්වීමක් වශයෙන් තරුණ කමිටුවේ සාමාජිකයන්ගේ දායකත්වයන් භාවනානුයෝගීන් සඳහා කැට ලබා දීමේ පුණ්‍ය කටයුත්ත ද ඉටු කළෙමු. මෙහි අරමුණ වන්නේ අසරණ සතුන් නිදහස් කිරීම හා ඉන් ලැබෙන පිං අපවත් වී වදාළ අති පූජ්‍ය අහංගම ආනන්ද මාහිමියන්ට අනුමෝදන් කිරීමයි.

මෙත් සවිය ටී ෂර්ට් අලෙවි කිරීම හා මෙත් සවිය සංවිධානය විසින් කරනු ලබන සියලු කටයුතු වලට හැකි උපරිම අයුරින් තරුණ කමිටුවේ සහයෝගය ලබා දෙන ලදී.



## මෙත් සවිය ටී ෂර්ට්

